**කොන්ක්‍රීට් කනුමත දිවෙන (Elevated) වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතිය - 2016**

---------------------------------------------------------------------- --------------------

කොන්ක්‍රීට් කනුමත දිවෙන වරාය ප්‍රවේශ මාර්ග ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පලමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 <u>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය</u>**

උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ආර්ථික කටයුතු වලට ධනාත්මක බලපෑමක් ඇතිකිරීම, ප්‍රාදේශීය පළාත් මාර්ග එකට එකතුවීම හරහා කොළඹ නගරයේ වාහන තදබදයට සහන සැලසීම, කොළඹ නගරයේ සිට ජාත්‍යන්තර ගුවන් තොටුපලට යෑම සඳහා ගතවන ගමන් කාලය අඩු කිරීම, වරායේ සිට කොළඹ වෙනත් ප්‍රදේශයන්ට භාණ්ඩ ප්‍රවාහනයේ වාහන තදබදයට සහන සැලසීම ව්‍යාපෘතියේ අරමුණ වේ. රේඛීය අමාත්‍යාංශය 2016 පෙබරවාරි 16 දින ඉදිරිපත් කළ සිහිවටන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව ව්‍යාපෘතියේ මුළු පිරිවැය රු.බිලියන 36.50 ක් විය. ව්‍යාපෘතියේ කටයුතු 2016 ජනවාරි මාසයේ ආරම්භ කළ අතර 2016 මාර්තු මස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබුණි. ව්‍යාපෘතිය 2020 මාර්තු මස නිම කිරීමට අපේක්ෂිතය.

**1.3 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 <u>විගණකගේ වගකීම</u>**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකණු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමණාකරනය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය පවත්වාගෙන යන ලද වැඩිදියුණුකළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සැසඳීමට පත්වන ලෙස සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සපයන ලද අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

## 2. <u>මූල්‍ය ප්‍රකාශන</u>

### 2.1 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

## 3. <u>මූල්‍ය හා භෞතික කාර්යසාධනය</u>

### 3.1 <u>අරමුදල් උපයෝජනය</u>

ලැබී ඇති තොරතුරු අනුව උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ අයවැය ඇස්තමේන්තු යටතේ රු. මිලියන 10 ක ප්‍රතිපාදනයක් කර තිබූ අතර ඉන් රු. මිලියන 3.31ක් ව්‍යාපෘති අධීක්ෂන ඒකකයේ වියදම් ලෙස වැයකර තිබුණි.

### 3.2 <u>භෞතික ප්‍රගතිය</u>

ආසියානු සංවර්ධන බැංකුව මගින් මූල්‍යයනය කරන ප්‍රාරම්භක ප්‍රවාහන පහසුකම් ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය හා ප්‍රාථමික නිර්මාන කටයුතු ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. හඳුනාගත් කොන්ක්‍රීට් කනුමත දිවෙන වරාය ප්‍රවේශ මාර්ගය මත භූමි මිනුම් කටයුතු එකග වූ බලයලත් මිනින්දෝරුවරයකුට රු. මිලියන 2.19කට ප්‍රදානය කර තිබීම හැරෙන්නට වෙනත් කටයුතු සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කර නොතිබුණි.

### 3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

ව්‍යාපෘති කාර්ය මණ්ඩලය 21 දෙනෙකුගෙන් සමන්විත වූ අතර ඉන් තනතුරු 12ක් සමාලෝචිත වර්ෂය තුල පුරවා තිබුණි.